# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2165/18 - 2020 මාර්තු මස 03 වැනි අඟහරුවාදා - 2020.03.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පාර්ලිමේන්තු මැතිවරණය - 2020**

තමාගේ ඡන්ද පොළ පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතුකොට ගෙන එම ඡන්ද පොළට ගොස් ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති තැනැත්තන්ට වෙනත් ඡන්ද පොළක දී ඡන්දය දීම සඳහා වූ පහසුකම

**1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 127 ආ වැනි වගන්තිය**

තමාගේ ඡන්ද පොළ පිහිටි ප්‍රදේශයේ පවතින තත්ත්වය හේතුකොට ගෙන, එම ඡන්ද පොළට ගොස් තමාගේ ඡන්දය දීමට නොහැකි වෙතැයි සාධාරණ බියක් ඇති ඡන්ද හිමියකුට වෙනත් ඡන්ද පොළක දී ඡන්දය දීම සඳහා පහසුකම් සලසා දෙන ලෙස ඉල්ලුම් කළ හැකිය. 1988 අංක 15 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතින් සංශෝධිත 1981 අංක 01 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 127 ආ වගන්තිය යටතේ ඒ සම්බන්ධ ප්‍රතිපාදන සලසා ඇත.

02. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත්‍ර සියලුම දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරි කාර්යාලවල මෙන්ම ප්‍රාදේශීය ලේකම් හා ග්‍රාම නිලධාරි කාර්යාලවලින් ලබා ගත හැකි ය. නීත්‍යානුකූලව නාමයෝජනා දැන්වීමේ දින සිට එනම් 2020.03.02 දින සිට දින 7ක් ඇතුළත දී, අදාළ ඉල්ලුම්පත් මැතිවරණ කොමසාරිස් ජනරාල්, මැතිවරණ මහලේකම් කාර්යාලය, සරණ මාවත, රාජගිරිය යන ලිපිනයට එවිය යුතු ය.

03. ඉල්ලුම්කරු පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි ලවා ඉල්ලුම් පත්‍ර සහතික කරවා ගත යුතු අතර ජාතික හැඳුනුම්පතේ අංකය ඉල්ලුම්කරු විසින් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කිරීම අවශ්‍ය වේ. ග්‍රාම නිලධාරි සහතිකය නොමැති ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ඉල්ලුම්කරුවන් විසින් 2019 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනය පදනම් කරගෙන ඡන්ද හිමි නාම ලේඛනයේ ඇතුළත් තොරතුරු ඉල්ලුම්පත්වල සැපයිය යුතු අතර එම නාමලේඛන සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල/කච්චේරිවල, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල තබනු ඇත.

මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් හා නියමය පරිදි,

සමන් ශ්‍රී රත්නායක,
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

2020 මාර්තු මස 03 වැනි දින,
සරණ මාවත,
රාජගිරිය,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.


1A - G 31977 — 167 (2020/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*